www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ බෝම්බ ප්‍රහාරය දුම්රිය මගීන් ඉලක්ක කර ගනී

## Bomb blast in Sri Lanka targets rail commuters

**සරත් කුමාර විසිනි**
**2008 ජුනි 2**

ශ්‍රී ලංකාවේ අගනුවර වන කොලඹ නගරාසන්නයේ පිහිටි දෙහිවල දුම්රිය නැවතුම් පොලේ දී මගීන් පිරි දුම්රියක් තුල පසු ගිය සඳුදා සිදු වූ බෝම්බ පිපිරීමකින් මගීන් 9 දෙනෙකු ඝාතනයට ලක් වූ අතර තවත් 80 දෙනෙකුට ආසන්න සංඛ්‍යාවක් තුවාල ලදහ. සවස 5.30ට පමන සිදු වූ මේ පිපිරවීම වැඩ අවසන් කොට ආපසු නිවෙස් බලා යමින් සිටි සාමාන්‍ය වැඩ කරන ජනයා සිතාමතා ඉලක්ක කර ගත්තේ ය. කවුරුන් වගකිව යුතු වුව ද, මේ බෝම්බ ප්‍රහාරය වනාහි රට තුල දැන් සිදු වෙමින් පවත්නා සිවිල් යුද්ධය මධ්‍යයේ වාර්ගික ආතතීන් ඇවිලවීම ඉලක්ක කර ගත් සාපරාධී ක්‍රියාවක් විය.

කොලඹ ආන්ඩුව හා ආරක්ෂක අමාත්‍යාංශය ප්‍රහාරය සම්බන්ධයෙන් සැනෙකින් බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට චෝදනා කල මුත් ඒ චෝදනා සනාථ කිරීම සඳහා කිසිදු සාක්ෂ්‍යයක් සම්පාදනය නොකලේ ය. කිලෝග්‍රෑම් 1.5ක් බරති බෝම්බය පස් වන මැදිරියේ ගමන් බඩු තබන උඩ රාක්කයක තබා තිබුනේ යැයි පොලීසිය කියා සිටියේ ය. දෙහිවල ප්‍රදේශයේ දිවි ගෙවන, උතුරේ යාපන අර්ධද්වීපයෙන් පැමිනි දෙමල ජාතික සැකකරුවෙකු අත් අඩංගුවට ගත් බව පොලීසිය ඊලඟ දා වාර්තා කලේ ය.

කිසිදු ප්‍රකාශයක් නිකුත් කර නැති නමුදු එල්ටීටීඊයට මේ බෝම්බ ප්‍රහාරය සිදු කිරීමේ හැකියාව නිසැක වශයෙන් ම පවතින අතර, එය මීට කලින් බහුතරය වශයෙන් සිංහල ජනයා වාසය කරන දිවයිනේ දකුනු ප්‍රදේශයේ දී අහිංසක සිවිල් ජනයා සිය ඉලක්කය කර ගෙන තිබේ. පෙබරවාරියේ දී, මරා ගෙන මැරෙන බෝම්බකරුවෙක් 14 දෙනෙකු ඝාතනයට ලක් කරමින් කොලඹ කොටුවේ දුම්රිය පොලෙහි පිපිරීමක් සිදු කලේ ය. 1996 ජුලි මාසයේ දී, එල්ටීටීඊය දෙහිවල ආසන්නයේ දී දුම්රියක බෝම්බ පිපිරවීමක් සිදු කල අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 56 දෙනෙකුට වඩා ඝාතනයට ලක් වී 200ක් පමන දෙනා තුවාල ලදහ.

මැයි 23 වන දා වෑන් රථයක් විනාශයට පත් කොට වයස අවුරුදු 12ට අඩු ලමුන් 4 දෙනෙකු ද ඇතුලුව සිවිල් වැසියන් 16 දෙනෙකු ඝාතනයට ලක් කල බෝම්බයක් ස්ථානගත කිරීම සම්බන්ධයෙන් එල්ටීටීඊය මිලිටරියේ ගැඹුරු විනිවිදුම් ඒකකයකට චෝදනා කලේ ය. පිපිරීම සිදු වූයේ කිලිනොච්චිය සමීපයෙහි පිහිටි එල්ටීටීඊ පාලනය යටතේ පවතින ප්‍රදේශයෙහි ය. හමුදාව වගකීම භාර ගැනීම ප්‍රතික්ෂේප කල මුත් මේ ප්‍රහාරයේ සැකකරුවන් බවට පත් වන්නට බෙහෙවින් ම ඉඩ තිබෙන්නේ එහි රහස් දිගු දුර විහිදුම් භට කන්ඩායම් හා ඒ හා සන්ධානගත වූ පැරා මිලිටරි කන්ඩායම් ය.

දෙහිවල දුම්රිය පොලේ දී මැයි 26 වන දා සිදු වූ බෝම්බ පිපිරවීම එල්ටීටීඊය පලි ගැනීමක් වශයෙන් කරන ලද්දක් විය හැකි ය. කොලඹ දේශපාලන සංස්ථාපිතය මෙන් ම, ආන්ඩුව හා මිලිටරිය විසින් ගෙන යනු ලබන ප්‍රතිගාමී යුද්ධය සම්බන්ධයෙන් "සිංහල ජනයාට" චෝදනා කරමින් එල්ටීටීඊය ද පදනම් වී සිටින්නේ වාර්ගික දේශපාලනය මත යි. අහිංසක සිංහල සිවිල් ජනයා ඉලක්ක කර ගැනීම මගින් වාර්ගික ආතතීන් තව දුරටත් ඉහල නැගීම සිදු වන අතර, එය ඍජුව ම ආන්ඩුවේ අත් ශක්තිමත් කරයි.

කෙසේ වුව ද, මිලිටරිය හෝ එහි සහායක පැරා මිලිටරි කන්ඩායම් විසින් දෙහිවල බෝම්බ ප්‍රහාරය සිදු කෙරුනේ ය යන කරුන බැහැර කල නොහැකි ය. 2006 දී දිවයින යලි යුද්ධය තුල ගිල්වා ඇති ජනාධිපති මහින්ද රාජපක්ෂ වැඩෙන දේශපාලන හා ආර්ථික අර්බුදයකට මුහුන දී සිටී. උතුරුදිග මිලිටරි ආක්‍රමන තථ්‍ය වසයෙන් ඇන හිට ඇති අතර, අස්ථාවර පාලක සන්ධානය යුද්ධය හා එහි ආර්ථික බලපෑම පිලිබඳව වැඩෙන අතෘප්තිකර භාවයට මුහුන දී සිටී. ආහාර, ඉන්ධන සහ අනෙකුත් මූලික භාන්ඩවල මිල ගනන් පිම්මේ ඉහල යයි.

මාධ්‍ය තුලින් සහ වර්ජිත කම්කරුවන්ගෙන් සහ උද්ඝෝෂනවල නියැලෙන ගොවීන්ගෙන් එල්ල වන මොන යම් හෝ විරුද්ධත්වයක් වුව මැඩ ලීම සඳහා රාජපක්ෂ ආන්ඩුව ප්‍රජාතන්ත්‍ර විරෝධී විධික්‍රම වඩ වඩාත් යොදා ගෙන තිබේ. නඩු විමසීමකින් තොරව රඳවා තැබා ගැනීම ඇතුලුව, ජනාධිපතිවරයාට, මිලිටරියට හා පොලීසියට අති විශේෂ බලතල පැවරෙන හදිසි තත්ත්වයක් බලපැවැත්වෙයි. ආන්ඩුවට හිතවත්

ඝාතක කල්ලි මගින් මිනිසුන් සිය ගනනක් "අතුරුදන්" කෙරී හෝ ඝාතනයට ලක් කෙරී තිබේ.

එල්ටීටීඊයට චෝදනා කිරීම සඳහාත් වාර්ගික වෛරය තව දුරටත් ඇවිස්සීම සඳහාත් කොලඹ දී බෝම්බයක් පිපිරවීමේ හැකියාව මිලිටරියට බෙහෙවින් තිබේ. 2005 නොවැම්බරයේ දී රාජපක්ෂ ජනාධිපති තනතුරට පත් වීමෙන් අනතුරුව මාස හයකටත් වැඩි කාලයක් තිස්සේ, එල්ටීටීඊය දුර්වල කිරීමේ ද පලි ගැනීම සඳහා එල්ටීටීඊය පොලඹවා ගැනීමේ ද ඉලක්කය ඇතිව හමුදාව සහ ඒ හා සන්ධානගත වූ පැරා මිලිටරි කන්ඩායම් උතුරේත් නැගෙනහිරේත් ප්‍රකෝපකරනයන්ගෙන් සහ ඝාතනවලින් සමන්විත සැඟවුනු යුද්ධයක් ගෙන ගියේ ය. 2006 ජුලි මාසයේ දී තමන්ගේ විවෘත ආක්‍රමන දියත් කරන්නටත් මේ වසරේ ජනවාරියේ දී 2002 සටන් විරාමය නිල වශයෙන් ඉරා දමන්නටත් මෙමගින් රාජපක්ෂට වේදිකාව සකසා දෙන ලදි.

කැත මෙහෙයුම් කර ගෙන යාම සම්බන්ධයෙන් මිලිටරි රහස් ඔත්තු සේවා ඒකක කුප්‍රසිද්ධ ය. පසු ගිය වසරේ පෙබරවාරියේ දී, කලින් නොදන්නා සංවිධානයක් වූ විප්ලවකාරී විමුක්ති ව්‍යාපාරයේ (විවිව) නායකයන් අත් අඩංගුවට ගත් හමුදාව ඔවුන් රඳවා තබා ගත්තේ ය. තමන් එල්ටීටීඊයෙන් පුහුනුව හා ආයුධ ලබා ගත් බවටත් දකුනේ සිදු කල බෝම්බ පිපිරවීම් කීපයක් සඳහා තමන් සම්බන්ධ වූ බවටත් ප්‍රශ්න කිරීම්වල දී රැඳවියන් පාපොච්චාරනය කලේ යැයි කියන ලදි. ඔවුන් "සිංහල කොටින්" යැයි හෙලා දුටු ආන්ඩුව සහ මිලිටරිය තමන් ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් උල්ලංඝනය කිරීම පිලිබඳ කාරනාවෙන් අවධානය වෙනතකට යොමු කිරීම සඳහා මෙම සිදුවීමට ලැබුනු ප්‍රසිද්ධිය ගසා කෑවේ ය.

මේ ක්‍රියාකාරකම්වලට මිලිටරි රහස් ඔත්තු සේවය සම්බන්ධ වී සිටි බවට *සන්ඩේ ලීඩර්* සහ *රාවය* පුවත්පත් විසින් එලිදරව් කෙරුනු විට ප්‍රචාරක ප්‍රහාරය ආ පස්සට කැරකුනි. මිලිටරි රහස් ඔත්තු සේවයේ එක් ඒජන්තයෙකු වූ "ශර්මාල්" නමැත්තා විවිව තුලට විනිවිද, එල්ටීටීඊය සැපයූ පුහුනුවට ද සහභාගි වී, එහි ආයුධ පිලිබඳ ප්‍රධානියා ලෙස කටයුතු කරමින් සිටි අතර, ඔහු විසින් අඩු ගනනේ එක් බෝම්බ ප්‍රහාරයක් වත් සංවිධානය කොට තිබුනි. ශර්මාල්ට ඉහල පෙලේ සම්බන්ධතා පැවති අතර, සිංහල අන්තවාදී ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) පාර්ලිමේන්තු කන්ඩායමේ හිටපු නායකයා වන විමල් වීරවංශ විසින් ජනාධිපතිගේ සොහොයුරා වන ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂට ඔහු හඳුන්වා දෙනු ලැබ තිබුනි.

මාස 15කට වැඩි කාලයකට පසුවත්, දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවය කල කීප දෙනෙකුගෙන් ද සමන්විත විවිව සාමාජිකයන් යැයි කියන ලද කන්ඩායම කිසිදු චෝදනා ඉදිරිපත් කිරීමකින් තොරව තව දුරටත් රඳවා ගනු ලැබ සිටිති. දුම්රිය කම්කරුවන් පමනක් නො ව, ඉහල වැටුප් ලබා ගැනීම සඳහා සහ සැලසුම් කොට ඇති පෞද්ගලීකරන පියවරයන්ට එරෙහිව උද්ඝෝෂනවල නියැලී සිටින කම්කරු පන්තියේ අනෙකුත් කොටස් ද බිය ගැන්වීමටත් ඔවුන්ට තර්ජනය කිරීමටත් ආන්ඩුව මෙම අත් අඩංගුවට ගැනීම යොදා ගත්තේ ය.

රාජපක්ෂ ආන්ඩුවත් මිලිටරියත් වඩ වඩා නීතියට ඉහලින් ක්‍රියා කරමින් සිටියි. පසු ගිය වසර දෙක තිස්සේ විරුද්ධවාදීන්ට සහ එල්ටීටීඊ හිතවාදීන් යැයි කියන ලද්දන්ට එරෙහිව සිදු කරනු ලැබ ඇති බොහෝ ඝාතන, අතුරුදන් කිරීම් හා වෙනත් මැර ක්‍රියාවන් සම්බන්ධයෙන් සැබවින් ම මෙතෙක් කිසිවෙකුට වගකීම පැවරී නැත. මැයි 22 වන දා, *නේෂන්* පුවත්පතේ ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදියෙකු වන කීත් නොයාර් පැහැර ගෙන ගොස්, වධබන්ධනයට ලක් කොට, තව දුරටත් යුද්ධය පිලිබඳව කිසිවක් නො ලියන ලෙස අනතුරු අඟවා ඔහුගේ නිවස අසල දමා ගොස් තිබුනි. රාජපක්ෂ මේ පිලිබඳව පරීක්ෂනයක් පවත්වන බව නිවේදනය කර ඇති මුත්, මේ සිදුවීම තුල ආරක්ෂක හමුදාවන්ගේ සම්බන්ධය ගැන කිසිදු බැරෑරුම් විමසා බැලීමක් සිදු නොවන බව කෙනෙකුට කල් තියා ම පෙරදැකිය හැකි ය.

පසු ගිය අඟහරුවාදා, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ වෘත්තීය පත්‍රකලාවේදීන්ගේ සංගමයේ නායකයන් වූ පෝද්දල ජයන්ත හා සනත් බාලසූරිය කැඳවා මිලිටරිමය කාරනා සම්බන්ධයෙන් කරනු ලබන මාධ්‍ය ආවරනයන් පිලිබඳව තරවටු කලේ ය. ආන්ඩුවත් යුද්ධයත් පිලිබඳව විවේචනාත්මක වන ප්‍රකාශ සිදු කිරීම සම්බන්ධයෙන් ඔහු ඔවුන්ට ඍජුව අනතුරු ඇඟවී ය. මාධ්‍ය වාර්තා කීපයක සඳහන් වූ පරිදි, යුද හමුදාපති ජනරාල් සරත් ෆොන්සේකාට "ගරු කරන" පුද්ගලයන්ගෙන් ඔවුන්ට හානි සිදු වන්නට ඉඩ ඇති බවට ආරක්ෂක ලේකම්වරයා ඔවුන්ට තර්ජනය කලේ ය.

ආන්ඩුව යුද්ධය යුක්ති සහගත කිරීම සඳහා දෙහිවල බෝම්බ ප්‍රහාරය ඩැහැ ගත්තේ ය. තෝරා ගත් මාධ්‍ය නියෝජිතයන් කන්ඩායමකට කතා කරමින් ජනාධිපති රාජපක්ෂ මෙසේ ප්‍රකාශ කලේ ය: "එල්ටීටීඊයෙන් එල්ල වෙන වියරු සහගත ප්‍රහාර හින්ද ත්‍රස්තවාදයට විරුද්ධ සටනෙ සැර බාල කිරීමක් සිද්ධ වේවි ය කියල කිසි කෙනෙක් බලාපොරොත්තු නො විය යුතු යි." උමතු සහගත තානයකින් ඔහු තව දුරටත් මෙසේ කියා සිටියේ ය: "එල්ටීටීඊයට සිද්ධ කෙරෙමින් තියෙන දේට වගකියන්න ඕන මම නිසා සිවිල් ජනයා අත ඇරල මාව ඉලක්ක කර ගන්න."

බෝම්බ පිපිරවීම සංවිධානය කෙරුනේ කවුරුන් විසින් වුව ද, ජීවන තත්ත්වයන් පිරිහීම හේතු කොට ගෙන

පුලුල්ව පැතිර යන කෝපාග්නියකට මුහුන දී සිටින ආන්ඩුවකට ප්‍රයෝජනවත් දේශපාලනික අපසරනයක් නිසැකව ම ඉන් සම්පාදනය වී තිබේ. මේ පසු ගිය සතියේ, ප්‍රවාහන වියදම් සහ අනෙකුත් අත්‍යවශ්‍ය භාන්ඩ හා සේවා මිල ගනන් ඉහල නංවමින් පෙට්‍රල්, ඩීසල් හා භූමිතෙල් මිල ගනන් සියයට 25කින් ඉහල ගියේ ය. මේ මිල ඉහල යාම්වලින් සැලකිය යුතු කොටසක් ඇති වන්නේ ජාත්‍යන්තර වශයෙන් සිදු වන මිල ඉහල යාම් නිසා වුව ද, දැවැන්ත මිලිටරි වියදම් ද අප්‍රේල් මාසයේ දී සියයට 30ට ආසන්න අගයකට ඉහල නැගි උද්ධමනය සමග සංයුක්ත වෙමින් තිබේ.

© www.wsws.org